සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

60 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය	I, II
வணிகக் கல்வியும் கணக்கீடும்	I, II
Business and Accounting Studies	I, II

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

උපදෙස්:

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

1. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාරම්පරික වෙද පවුලකින් පැවත එන අමිල, ගිරන්කුල ග්‍රාමයෙහි ආයුර්වේද වෛද්‍යවරයෙකි. ඔහු තම පියා විසින් ලබා දුන් රු. 500 000 ක් වටිනා ගොඩනැගිල්ලෙහි අක්ෂි රෝග සඳහා ආයුර්වේද ඖෂධ නිෂ්පාදන සකස් කර, විකිණීමේ ව්‍යාපාරයක් රු. 800 000 ක් මුදලින් යොදා 2024.01.01 දින 'ආයුරා' නමින් ආරම්භ කරන ලදී. එදින ම ඔහු රු. 400 000 ක යන්ත්‍ර හා උපකරණ මිල දී ගත්තේ ය. 'ආයුරා' නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සමහරක් ගිරන්කුල ග්‍රාමයෙන් මිල දී ගනියි. අමුද්‍රව්‍යවල ගුණත්වය ආරක්ෂා වන පරිදි හිරු එළියේ වේලා ඒවා ඖෂධ නිෂ්පාදන සඳහා යොදා ගනියි.

2024.01.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

	රු.
අමුද්‍රව්‍ය මිල දී ගැනුම්	350 000
දූරකථන වියදම්	5 000
වැටුප් - නිෂ්පාදන සේවක	45 000
විකුණුම් සේවක	60 000
අනෙකුත් නිෂ්පාදන වියදම්	30 000
ප්‍රචාරණ වියදම්	15 000
බෙදාහැරීමේ රථ කුලී	150 000
ණයට විකුණුම්	900 000

අමතර තොරතුරු:

- 2024.01.31 දිනට අමුද්‍රව්‍ය තොග සහ නිමි භාණ්ඩ තොග කිසිවක් නොමැත.
- යන්ත්‍ර හා උපකරණ වාර්ෂිකව 6% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.
- 2024.01.31 දිනට මාසික විදුලිබිල රු. 10 000 ක් ගෙවා නොමැත.

දූරකථනය, ෆැක්ස් පණිවුඩ හා විද්‍යුත් තැපෑල මගින් ලබා ගන්නා දේශීය පාරිභෝගිකයින්ගේ ඇණවුම් බෙදාහැරීම ව්‍යාපාරය විසින් සිදු කරනු ලබයි. විදේශීය පාරිභෝගිකයින්ගෙන් මාර්ගගත ඇණවුම් ලබා ගැනීම සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කරමින් පවතින අතර ව්‍යාපාරයට සෘජු මාර්ගගත ගෙවීම් කවුළුවක් ලබා ගැනීමට තීරණය කර ඇත.

(i) (අ) 'ආයුරා' ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) 'ආයුරා' ව්‍යාපාරය අරමුණ අනුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) (අ) 'ආයුරා' ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) විද්‍යුත් ලිඛිත සන්නිවේදන මාධ්‍යය සඳහා ඉහත සිද්ධියේ ඇතුළත් සන්නිවේදන ක්‍රම **දෙකක්** ලියන්න.

[අටවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) 'ආයුරා' ව්‍යාපාරයේ පහත එක් එක් දෑ අයත් වන නිෂ්පාදන සාධකය නම් කරන්න.

(අ) නිෂ්පාදන සේවකයෝ

(ආ) ව්‍යාපාර ගොඩනැගිල්ල

(ඉ) අමුද්‍රව්‍ය වියළීම සඳහා භාවිත කරන හිරුඑළිය

(ඊ) අම්ලගේ ව්‍යාපාර සංවිධාන හැකියාව

(iv) (අ) ඉහත සිද්ධියේ ඇතුළත් කළමනාකරණ කාර්යයන් වන සැලසුම්කරණය හා සංවිධානකරණය සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) මාර්ගගත ක්‍රමයට ඇණවුම් ලබා ගැනීම අයත්වන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය කුමක් ද?

(v) 2024.01.01 දිනට 'ආයුරා' ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියන්න.

(vi) විකුණුම් රු. 900 000 සටහන් කිරීමට අදාළ

(අ) මූලාශ්‍ර ලේඛනය කුමක් ද?

(ආ) මූලික පොත් කුමක් ද?

(vii) (අ) 2024.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙල කරනු ලබන ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ දැක්වෙන යන්ත්‍ර හා උපකරණවල ක්ෂය වටිනාකම කොපමණ ද?

(ආ) ඉහත (vii) (අ) හි සඳහන් කළ ක්ෂය වටිනාකම ගිණුම්ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(viii) (අ) 'ආයුරා' නිෂ්පාදනවල ප්‍රාථමික පිරිවැයට ඇතුළත් වන වියදම් **දෙකක්** වටිනාකම් සහිතව ලියන්න.

(ආ) 'ආයුරා' ව්‍යාපාරයේ විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් **දෙකක්** වටිනාකම් සහිතව ලියන්න.

(ix) 2024.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආයුරා ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(x) (අ) 2024.01.31 දිනට 'ආයුරා' ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල මුළු වටිනාකම කොපමණ ද?

(ආ) 2024.01.31 දිනට 'ආයුරා' ව්‍යාපාරයේ හිමිකම කොපමණ ද?

(ලකුණු 02 × 10 = 20 යි)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) කේවල ස්වාමි ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාර සංවිධාන අයිතිය අනුව පෞද්ගලික හා පොදු අංශ ලෙස වර්ග කෙරේ.

(ආ) අභ්‍යන්තර පරිසර සාධක අධ්‍යයනය තුළින් ව්‍යාපාර අවස්ථා හා ශක්තීන් හඳුනා ගැනේ.

(ඉ) ව්‍යාපාර ගොඩනැගිල්ල පිහිටි ඉඩම සෑම විට ම නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.

(ඊ) ව්‍යාපාරයක අයිතිකරු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් වුව ද අසීමිත වගකීමකට යටත් වේ.

(ලකුණු 02 යි)

(iii) පහත දැක්වෙන්නේ ව්‍යාපාර වර්ග දෙකකි.

A – කොළඹ ජාතික රෝහල

B – සුමග රියදුරු පාසල

(අ) ඉහත **A** හා **B** සපුරාලන මිනිස් අවශ්‍යතා මොනවා ද?

(ආ) ඉහත **A** හා **B** ව්‍යාපාර නිෂ්පාදිතයේ ස්වභාවය අනුව වර්ග කර දක්වන්න. (ලකුණු 02 යි)

(iv) මහා පරිමාණ සුපිරි වෙළෙඳසැල් ජාලයක් හිමි අරවින්ද ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන, වට්ටම් තීරණය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය හා රෝබෝවරුන් යොදා ගැනීමට තීරණය කර ඇත.

(අ) ඉහත සිද්ධියේ සුපිරි වෙළෙඳසැල අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් තාක්ෂණික පරිසර සාධකයක් ලියන්න.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

3. (i) දේපළ රක්ෂණය හා ජීවිත රක්ෂණය අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට වාණිජ බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක් තිබීම අවශ්‍ය වේ.

(ආ) විද්‍යුත් තැපෑල, ව්‍යාපාරයක අභ්‍යන්තර මෙන්ම බාහිර සන්නිවේදන ක්‍රමයකි.

(ඉ) හානිපූරණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ නොවේ.

(ඊ) යාපනය දුම්රිය ස්ථානය ප්‍රවාහන මූලිකාංගයක් වන පර්යන්තයට නිදසුනකි. (ලකුණු 02 යි)

(iii) ඇඟලුම් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අමර, මිලදී ගත් අමුද්‍රව්‍ය සඳහා සරත්ට රු. 100 000 ක චෙක්පතක් නිකුත් කරන ලදී. අමර තම ජංගම ගිණුම මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අතර, සරත් ලංකා බැංකුවේ පවත්වා ගෙන යයි.

(අ) ඉහත සිද්ධියෙහි ඇතුළත් චෙක්පතෙහි අණලදු හා අණකරු නම් කරන්න.

(ආ) අමරගෙන් ලද චෙක්පත සම්බන්ධයෙන් සරත්ට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) බෑග් නිෂ්පාදන ව්‍යාපාරයක කළමනාකරු වන දීපාල්ට, ගනුදෙනුකරුවෙකු විසින් බෑග් 50 ක් අවශ්‍ය බව දුරකථනයෙන් දැනුම් දුන්නේ ය. දීපාල් ඇණවම භාර ගෙන දින දෙකක් ඇතුළත බෑග් සපයන බවට සහතික විය.

ඉහත සිද්ධියට අදාළ සන්නිවේදන ක්‍රියාවලියේ එක් එක් සන්නිවේදන මූලිකාංගය සඳහා නිදසුන් ලියන්න.
(ලකුණු 02 යි)
(මුළු ලකුණු 08 යි)

4. (i) 'ඉලක්ක වෙළෙඳපොළක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ඉහළ ප්‍රතිලාභයක් අපේක්ෂිත ආයෝජනවල ඉහළ අවදානමක් ගම්‍ය වේ.

(ආ) ව්‍යාපාර ආයතනයක් විසින් ලබා දෙන වට්ටම් අලෙවිකරණ මිශ්‍රයේ මිල විචල්‍යයට අයත් වේ.

(ඉ) කළමනාකරණ ක්‍රියාවලියේ පළමු කාර්යය සංවිධානකරණයයි.

(ඊ) රජයට අවශ්‍ය දිගුකාලීන ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.
(ලකුණු 02 යි)

(iii) පහත දැක්වෙන්නේ අලෙවි කළමනාකරුවෙකු විසින් හඳුන්වා දීමට යෝජිත උණුසුම රඳවන වතුර බෝතලයක් පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A – බෝතලයේ උස 15 cm වන අතර, කොළ පැහැය සහිත වේ.

B – මූලික හඳුන්වාදීම පාසල් අසල සිදු කරයි.

C – පිරිවැයට 10% ක ලාභාන්තිකයක් සහිතව මිල කරයි.

D – ප්‍රචාරණය රූපවාහිනිය මගින් සිදු කරයි.

ඉහත **A**, **B**, **C** හා **D** යන එක් එක් ප්‍රකාශවල ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය ලියන්න. (ලකුණු 02 යි)

(iv) රුවිනි තම ඉතිරිකරගත් මුදල් පහත දැක්වෙන ආයෝජනවල ආයෝජනය කිරීමට අදහස් කරයි.

A – කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල

B – රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පතුවක

C – රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ තැන්පතුවක

D – ස්වර්ණාභරණ මිල දී ගැනීමට

(අ) රුවිනි ප්‍රාග්ධන ලාභ ලැබීමට අදහස් කරයි නම් ඔබ නිර්දේශ කරන ආයෝජනය කුමක් ද?

(ආ) රුවිනි ස්ථාවර මාසික පොලියක් ලැබීමට අදහස් කරයි නම්, ඔබ නිර්දේශ කරන ආයෝජනය කුමක් ද?
(ලකුණු 02 යි)
(මුළු ලකුණු 08 යි)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) 'ගිණුම්කරණය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් එක් එක් ගිණුම අයත්වන ගිණුම් වර්ගය සඳහන් කරන්න.

(අ) ණයගැති ගිණුම (ආ) ගැනිලි ගිණුම

(ඉ) විකුණුම් ගිණුම (ඊ) බැංකු ණය ගිණුම (ලකුණු 02 යි)

/හෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) (අ) 2024.01.01 දින සහන් රු. 100 000 ක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. මෙම ගනුදෙනුවෙන් පසු සහන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය ලියන්න.

(ආ) ඉහත (iii) (අ) හි සඳහන් සහන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය එක් ගනුදෙනුවකින් පසු පහත දැක්වෙන පරිදි විය.

වත්කම්	=	හිමිකම්	+	වගකීම්
රු. 200 000		රු. 100 000		රු. 100 000

එම ගනුදෙනුවෙන් මුදල් වත්කම් රු. 100 000 කින් වැඩි විය. සිදු වී ඇති ගනුදෙනුව ලියන්න.

(ඉ) පුබුදුගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. **10 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම**
2. රු. 20 000 ක් ණයගැතියෙකුගෙන් ලැබීම
3. රු. 35 000 ක් වූ බඩු තොගයක් රු. 50 000 කට ණයට විකිණීම

ඉහත එක් එක් ගනුදෙනුව පුබුදුගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පිළිතුරු සැපයීමට පහත දැක්වෙන පරිදි ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුවේ බලපෑම දී ඇත.)

ගනුදෙනු අංකය	වත්කම්	හිමිකම්	වගකීම්
1	වැඩිවේ	–	වැඩිවේ
2			
3			

(ලකුණු 04 යි)

(iv) 2024.03.01 දිනට සුරන්ගේ ව්‍යාපාරයේ මුදල් පොතේ ශේෂය රු. 15 800 ක් විය. 2024 මාර්තු මාසයේ මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු පහත දී ඇත.

දිනය	ලදුපත් අංකය	වවුචර් අංකය	විස්තරය
2024.03.05	15	-	රු. 35 000 කට භාණ්ඩ අත්පිට විකිණීම
2024.03.10	-	24	රු. 60 000 ක ලී බඩු මිල දී ගැනීම
2024.03.17	16	-	ණයගැතියකුගෙන් රු. 45 000 ක් ලැබීම
2024.03.29	-	25	රු. 15 000 ක විදුලි බිල ගෙවීම

අවශ්‍ය වන්නේ :

සුරන්ගේ ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කර 2024.03.31 දිනට මුදල් ශේෂය දැක්වීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

6. (i) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ අවසාන ශේෂ අසමානවීමට බලපෑ හේතු දෙකක් පහත දැක්වේ.

1. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්
2. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්

ඉහත සඳහන් එක් එක් හේතුව නිසා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය අඩු වේ ද, වැඩි වේ ද යන්න සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් එක් එක් නිෂ්පාදිතයට අදාළ පිරිවැය වර්ගය සඳහා නිදසුනක් බැගින් ලියන්න.

අංකය	නිෂ්පාදිතය	පිරිවැය වර්ගය	නිදසුන
1	පාන්	සෘජු ද්‍රව්‍ය පිරිවැය	.....
2	පාසල් නිල ඇඳුම්	සෘජු ශ්‍රම පිරිවැය	.....

(ලකුණු 02 යි)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) නිමන්තිගේ පාපිස්නා මැසීමේ ව්‍යාපාරයේ 2024 අප්‍රේල් මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

	රු.
රෙදි කැබලි මිලට ගැනීම	60 000
රෙදි මැසීමේ යන්ත්‍රයක් ණයට ගැනීම	120 000
(මෙය වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරයි)	
නූල්, ඉඳිකටු හා වෙනත් අවශ්‍ය දෑ ගැනීම	2 000
පාපිසි මසන්නාට වැටුප් ගෙවීම	40 000
මසන ස්ථානය පිරිසිදු කරන්නාට වැටුප් ගෙවීම	10 000
අප්‍රේල් මාසයේ විදුලිබිල ගෙවීම	5 000
ව්‍යාපාර ස්ථානයේ මාසික කුලිය ගෙවීම	8 000

- එක් පාපිස්නාවකු නිෂ්පාදන පිරිවැය රු. 126 කි.

අවශ්‍ය වන්නේ :

(අ) 2024 අප්‍රේල් මාසයේ නිෂ්පාදන පිරිවැය ලේඛනය

(ආ) 2024 අප්‍රේල් මාසයේ නිෂ්පාදනය කළ පාපිසි සංඛ්‍යාව (ලකුණු 04 යි)

(iv) ව්‍යාපාරයක ආධුනික ගිණුම් ලිපිකරු විසින් 2024.03.31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් විස්තරය පහත දැක්වේ.

බැංකු සැසඳුම් විස්තරය

		රු.	රු.
2024.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය			33 000
එකතු කළා :	ණයගැනි සෘජු ප්‍රේෂණ	13 000	
	තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්	24 000	37 000
			70 000
අඩු කළා :	බැංකු ණය වාරිකය	5 000	
	චෙක්පොත් ගාස්තුව	1 000	
	නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්	15 000	(21 000)
බැංකු ප්‍රකාශනයේ ශේෂය			49 000

අවශ්‍ය වන්නේ :

(අ) 2024.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2024.03.31 දිනට නිවැරදි බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

7. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ලැබීම් හා ගෙවීම් ගිණුමේ බැරට සටහන් කරන එහෙත් ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් **නොකරන** අයිතම **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ගිණුම් පොත්වලින් උපුටාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

වර්ෂය තුළ ලැබීම්	වර්ෂය තුළ ගෙවීම්
සාමාජික මුදල් රු. 30 000	ක්‍රීඩාගාරය නඩත්තු වියදම් රු. 12 000
පරිත්‍යාග රු. 10 000	විදුලිය ගාස්තු රු. 8 000

අතිරේක තොරතුරු :

- 2023.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් රු. 2 000 කි.
- 2023.12.31 දිනට උපචිත විදුලි ගාස්තු රු. 6 000 කි.

අවශ්‍ය වන්නේ :

දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් කළ යුතු අයිතම **හතරක්** වටිනාකම් සහිතව ලියන්න. (ලකුණු 02 යි)

[දොළොස්වැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

(iii) දුමින්දගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2023.12.31 දිනට ශේෂ පිරික්සුම් පහත දැක්වේ.

	හර (රු.)	බැර (රු.)
ගැනුම්	380 000	
විකුණුම්		550 000
2023.01.01 දිනට තොගය	80 000	
ගෙනඒමේ කුලී	10 000	
ණයගැතියෝ	190 000	
ණයහිමියෝ		244 000
10% බැංකු ණය		100 000
ගෙවූ ණය පොලී	6 000	
බෙදාහැරීමේ රථ (පිරිවැයට)	400 000	
බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම (2023.01.01 දිනට)		40 000
ලී බඩු හා උපකරණ (පිරිවැයට)	120 000	
විදුලි ගාස්තු	60 000	
ප්‍රචාරණ වියදම්	44 000	
මුදල් ශේෂය	44 000	
ප්‍රාග්ධනය		400 000
	1 334 000	1 334 000

අතිරේක තොරතුරු :

- 2023.12.31 දිනට තොගය රු. 88 000 කි.
- බෙදාහැරීමේ රථ වාර්ෂිකව 5% බැගින් ද, ලී බඩු හා උපකරණ වාර්ෂිකව 10% බැගින් ද, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.

අවශ්‍ය වන්නේ :

(අ) දුමින්දගේ ව්‍යාපාරයේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04 යි)

(ආ) 2023.12.31 දිනට දුමින්දගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

* * *